**ගොවිජන සංවර්ධන අරමුදල - 2018**

**1.1 අහිතකර මතය**

ගොවිජන සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හේතුවෙන්, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක්ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ ගොවීන් වෙත ණය පදනම මතලබා දී තිබුණු ජල පොම්ප 140 හා ට්‍රැක්ටර් 2,464 සඳහා අය විය යුතු රු. 153,986,174 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. එසේ වුවදසමාලෝචිත වර්ෂයේ ගොවීන්ගෙන් අය කළ රු. 27,149,565 ක් වූ ණය වාරික මුදල වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් හිඟ වාරික ගිණුම්ගත කිරීම සඳහා ට්‍රැක්ටර් තැන්පතු ගිණුම විශ්ලේෂණය කල යුතුව ඇති අතර ඒ සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් කමිටුවක් පත් කර ඇත. | අයවිය යුතු ජලපොම්ප හා ට්‍රැක්ටර් වාරික ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අලෙවිසැල් සංවර්ධනය සහ මධ්‍යස්ථාන ගොඩනැගිලි සංවර්ධනය සඳහා පිළිවෙලින් දරන ලද රු. 6,197,039 ක හා රු. 6,069,613 ක මුදල ප්‍රාග්ධනිත නොකර වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බලා 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගොඩනැගිලි ඉදිකිරීම, නවීකරණය කිරීම සඳහා වැය කළ මුදල් ප්‍රාග්ධනිත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුත්තලම දිස්ත්‍රික්කයේ කුඩා වැව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රාක්ක ගැසීම සහ වීදුරු කබඩ් මිලදී ගැනීම වෙනුවෙන් වැය කළ රු. 95,500 ක මුදල ප්‍රාග්ධනිත නොකර වර්ෂයේ වියදමක් ලෙස කපා හැර තිබුණි. | 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාක්ක ගැසීම හා වීදුරු කබඩ් මිලදී ගැනීමට වැය කළ මුදල ප්‍රාග්ධනිත කළ යුතු වීම. |

### 1.5.3 පැහැදිලි නොකළ වෙනස්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 241,158,980 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 241,821,612 ක් විය. ඒ අනුව රු. 662,632 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා පත් කර ඇති කමිටුව විසින් මෙම නිරවුල් කිරීම සම්බන්ධව කටයුතු කරමින් සිටින අතර,කමිටුවේ නිර්දේශයන් මත ශේෂයට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | තැන්පතු ගිණුමේ වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත 2010 වර්ෂයේදී ලබාදී තිබුණු රෝද 02 ට්‍රැක්ටර් ට්‍රේලර් හා රෝද 04 ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා අයවිය යුතු රු.6,194,575 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ට්‍රැක්ටර් 2006, 2008, 2010 හා 2012 වැනි වර්ෂවලදී ලබා දී ඇති බැවින් තව දුරටත් හිඟ වාරික ගෙවීමට කාලය ලබා දීම සුදුසු නොවන බැවින් තව දුරටත් හිඟ වාරික නොගෙවන ට්‍රැක්ටර් දෙපාර්තමේන්තුව වෙත අත්පත් කරගෙන විධිමත් පරිදි බැහැර කිරීම සඳහා යෝජනාවක් සකසා ඇත. | ට්‍රැක්ටර් ට්‍රේලර් ණය වාරික මුදල් අය කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වනාතවිල්ලුව පටකරෝපණ විද්‍යාගාරය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී ලබාදී තිබූ රු.518,000 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි අත්තිකාරම් මුදල වූ රු.518,000 ක මුදල පියවන ලෙස දන්වා සිහිකැඳවීම් යැවීමට කටයුතු කර ඇත. | මධ්‍යස්ථානයට ගෙවා ඇති මුදල අය කරගත යුතු වීම. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 371(2) සංශෝධනය කරන ලද 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් මුදල් ලබාගෙන කාර්යය අවසන් වූ විගස පියවීම් සිදු කළ යුතු වුවත් 2018 සැප්තැම්බර් මාසයේදී ලබාගත් රු. 100,000 ක අත්තිකාරම් මුදල දින 94 ක ප්‍රමාදයෙන් පසුව සම්පූර්ණ මුදලම ආපසු තැන්පත් කර තිබුණි. | දෙපාර්තමේන්තු පිරිත් පිංකම සඳහා දෙපාර්තමේන්තුවේ සුභසාධක සංගමය රු.100,000 ක මුදලක් දැරීමට එකඟ විය. එසේ වුවද ඒ වන විට සුභසාධක සංගමයේ නිලධාරී මණ්ඩලය ස්ථානමාරු වී තිබූ බැවින් මාණ්ඩලික නිලධාරී රැස්වීමේ දී සුභසාධක සංගමයේ නවක නිලධාරී පත්කරන තුරු එම මුදල ගොවිජන සංවර්ධන අරමුදලින් දැරීමට තීරණය කළ අතර ඒ අනුව 2018 සැප්තැම්බර් 28 දින රු. 100,000ක මුදලක් දෙපාර්තමේන්තු පිරිත් පිංකම සඳහා නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත අත්තිකාරම් ලෙස ලබා දී ඇත. නමුත් සුභසාධක සංගමයේ නිලධාරී මඩුල්ල පත්වීම 2019.01.01 දක්වා ප්‍රමාද වීම මත අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇති අතර 2018.12.31 දින මාණ්ඩලික නිලධාරීන්ගෙන් එකතු කරගත් මුදල් නැවත බැදීමෙන් සම්පූර්ණ මුදල ගෙවා අත්තිකාරම පියවා ඇත. මේ සඳහා ගොවිජන සංවර්ධන අරමුදලෙහි වියදම් දරා නොමැත. | අත්තිකාරම් අදාළ කාර්යය සඳහා භාවිතා කිරීමට නොහැකි වුවහොත් වහාම පියවීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 49,014,580 ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 50,009,002 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 994,422 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අවසරපත්‍ර ගාස්තු හා ගොඩකිරීම් ආදායම රු. 9,426,226 කින් අඩුවීම, නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීමේ වියදම රු. 1,909,295 කින් වැඩිවීම හා නිලධරයන් පුහුණු වියදම රු. 1,207,905 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී කොළඹ හා ගම්පහ දිස්ත්‍රික් කාර්යාල විසින් කුඹුරු ඉඩමක් නොවන බවට සහතික ලබා දීම හා කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට සහතික ලබා දීම සඳහා අයදුම්කරුවන් 18 කගෙන් 2018 පෙබරවාරි සහ මාර්තු මාසවල රු.3,159,355ක මුදලක් අරමුදල විසින් ලබාගෙන තිබුණද, 2019 අප්‍රේල් 17 දින දක්වා එම අවසරපත්‍ර නිකුත් කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | මුදල් ලබාගත් කාර්යය ඉටු කිරීමට හෝ මුදල් ආපසු ලබාදීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) 2006 වර්ෂයට පෙර හඳුනාගෙන තිබුණු රු.450,000ක තොග ඌනතාවයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | මෙම ඌණතාවය පිළිබඳ සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර, අදාල නිර්දේශයන් ලැබීමෙන් පසු තොග ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | තොග ඌණතාවය සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ කර්තව්‍ය හා කාර්යයක් වූ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා සමාලෝචිත වර්ෂය තුළ හා පසුගිය වර්ෂවල වියදම් දරා නොතිබුණු නමුත් අරමුදලේ කාර්යයක් නොවූ ගොවි උපහාර උළෙලක් සහ ගොවිජන අභිමන් වැඩසටහනක් පැවැත්වීම සඳහාපිළිවෙළින් රු. 1,667,675 ක් සහ රු. 831,500 ක් වැය කර තිබුණි. | පනතේ 97(3) වගන්තියේ දැක්වෙන නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීම, සැපයුම් වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම උදෙසා සිදු කරන ලද්දකි. | පනතේ දක්වා ඇති කාර්යයන් පමණක් සිදු කළ යුතු වීම. |

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගොවිජන සංවර්ධන අරමුදල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරමි. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. |